3 වන පිටෙන්

තත්ත්වයක් වලකා ගැනීම සඳහා යොදාගත යුතු ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිකර්ම පිළිබඳ අවබෝධයක් දෙමළ හා මුස්ලිම් නායකයන්ට තිබුණා නැත. අනෙක් අතට සුලු ජාතීන් අතර ගොඩනැගෙමින් තිබුණු බිය පහකිරීම සඳහා යොදාගත හැකි ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිකර්ම පිළිබඳ අවබෝධයක් සිංහල නායකයන්ටත් නොතිබුණි.

පොන්නම්බලම්ගෙ පණහට පණහේ ඉල්ලීම ජාතීන් අතර පැවති එම ප්‍රවේශයේ අවුල් සහගත බව හා ප්‍රජාතන්ත්‍ර විරෝධී බව හොඳින් පෙනුන්මි කළ අවස්ථාවකි. 1925 ඇති වූ බෙදීම නිදහස දක්වා බලපාන ස්ථිර බෙදීමක් බවට පත්විය. සුලුජාතික නායකයන් කල්පනා කළ ආකාරයේ අවුල් සහගත බවක් තිබුණා සේම, සිංහල නායකයන් කල්පනා කළ ආකාරයේ අවුල් සහගත බවක්ද තිබුණේය. දෙගොල්ලන්ටම ඒ සඳහා ඇතිකර ගතයුතු ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිකර්ම පිළිබඳ අවශ්‍ය මනා අවබෝධයක් නොවීය. ඒ කාලයේ ජාතිය ගොඩනැගීම පිළිබඳ අවබෝධයක් තිබුණු එකම සංවිධානය ලෙස සැළකිය හැක්කේ යාපනයේ තරුණ සංගමය පමණකි. ඔවුනු කුල භේදයට එරෙහිව පෙනී සිටියහ. සිංහල දෙමළ මුස්ලිම් සමගියක් වෙනුවෙන් පෙනී සිටියහ. එහෙත් ඔවුන් ඉන්දියානු කොන්ග්‍රසයේ කාබන් පිටපතක් ලෙස ක්‍රියා කිරීමට උත්සාහ දැරීම තුළ තමන්ගෙ පැවැත්ම ඉක්මනින් අහිමි කර ගත්හ. ඇත්ත වශයෙන්ම මේ කාලයේ ලංකාවේ මාක්ස්වාදීන්ටත් මේ ප්‍රශ්නය නිරවුල් කරගැනීම සඳහා කිසිම ප්‍රවේශයක් නොවීය. ඔවුන් අතින් වුයේද මේ ප්‍රශ්නය උග්‍ර කිරීම සහ අවුල් කිරීමය. ඔවුන්ට වැදගත් වුයේ ජාතිය නොව පන්තියයි. ඉන්දියාවේ මාක්ස්වාදීන් ජාතිය ගොඩනැගීමේ ව්‍යාපාරයට සෘජෙන දායකත්වයක් ලබාදී ඇත. ලංකාවේ මාක්ස්වාදීන්ට ඒ කාර්යභාරය ඉටුකරගත නොහැකි විය. අවසානයේ ලංකාවට නිදහස ලබාදෙනවාට විරුද්ධවෙන සමාජ ප්‍රවනතා දෙකක් ගොඩනැගී තිබුණි. ඉන් එකක් සුලුජාතීන්ගෙන්ද අනෙක පීඩිත කුලවලින්ද සමන්විත විය.

නිදහස ලැබීමෙන් සිංහල ආධිපත්‍යයක් ඇති වී, ඔවුන් අතින් තමන් පීඩාවට ලක්වෙන තත්ත්වයක් ඇතිවනු ඇතැයි කියා සුලු ජාතික නායකයන් කල්පනා කළහ. නිදහස ලැබී ගොවිගම හා වෙල්ලාල ආධිපත්‍යයක් ඇති වී තමන් පීඩාවට පත්කරන තත්ත්යක් ඇතිවනු ඇතැයි පීඩිත කුලවල නායකයන් කල්පනා කළහ. මේ කණ්ඩායම් දෙක වෙනවෙනම පළමුව ඩොනමෝර් කොමිසමටත්, දෙවනුව සොල්බරි කොමිසන් සභාවටත් තමන්ගෙ දුක් ගැනවිලි ඉදිරිපත් කළහ. ඒ වනවිට සුලු ජාතීන්ගේ ප්‍රශ්නයට අතිරේකව පීඩිත කුල පිළිබඳ බරපතල ප්‍රශ්නයකුත් රටේ පැවති බව ඉන් පෙනෙයි. යාපනේ මේ තත්ත්වය තිබුණේ දකුණටත් වඩා ගිනිගනිමින් තිබෙන තත්ත්වයක. නිදහස දිනා ගන්නා ලද්දේ එම ප්‍රධාන ප්‍රශ්න දෙකට විසඳුමක් නැතිවය. නිදහස ලැබීමෙන් පසුත්, ප්‍රශ්න දෙක විසඳාගැනීමට උත්සාහ ගැනීමක් සිදුනොවීය. නිදහස ලබාගත්තේ ජාතික රාජ්‍ය සඳහා අවශ්‍ය ජාතිය ගොඩනගා ගැනීමකින් තොරවය. නිදහසින් පසුත් ඉදිරියට යන්නට උත්සාහ කළේ ජාතිය ගොඩනගා ගැනීමේ උත්සාහයකින් තොරවය. ඉන්පසු සුලුජාතීන්ට සේම සියලු කුලවල ජනයාටද ජීවත් වන්නට සිදුවුයේ සමාන අයිතිවාසිකම් හා සමාන ගෞරවය අභිමිකරනු ලැබූ දෙවෙනි පෙළ තත්ත්වයකය. ඒ අශෝඛන තත්ත්වය ඊට ගොදුරු වී සිටි තරුණ තරුණියන් යක්ෂාවේශ වී ක්‍රියාකරන තත්ත්වයකට තල්ලු කිරීමට හේතු විය. අවසානයේ ලංකාව නිදහස ලබාගත්තේ එකම ලේ බින්දුවක්වත් සොලවන්නේ නැතිවය. එහෙත් එකම ලේ බින්දුවක් නොසොල්වා නිදහස ලබා ගත් රට නිදහස ලැබී අවුරුදු 30කට පසුව එක දිගට අවුරුදු 30ක්ම ලේ ගලන රටක් බවට පත් විය. ජාතිය ගොඩනගාගැනීමට අසමත් වීම මේ ලේ වැගිරීම කෙරේ බලපෑ ප්‍රධාන හේතුව ලෙස සැළකිය හැකිය. ඒ ලේ වැගිරීම කෙරෙහි වර්ගය පමණක් නොව කුලයද බලපෑවේය.

විජේවීර කරාව කුලයේ කෙනෙකු වන විට, ඔහුගේ දෙවෙනියා සොළි කුලේ කෙනෙකු විය. ප්‍රභාකරන් කරයා කුලේ කෙනෙකුවන විට ඔහුගේ දෙවෙනියා බාබර් කුලේ කෙනෙකු විය. සමස්ත අර්බුදය කෙරෙහිම බලපෑ ප්‍රධාන හේතු දෙක එම නිදර්ශන දෙක තුළ හොඳින් සංඛේතවත් වෙයි. මෙම අර්බුධය තුළ, වර්ගය ප්‍රසිද්ධියේ කැරලි ගසන විට කුලය සැඟවී ගරිල්ලා යුද්ධයක් කළේය.

මහා විනාශයක් ඇතිවීමෙන් පසුව, නිදහස් ස්වෛරී සම්පූර්ණ කරගැනීමට අසමත් වූ ජාතිය ගොඩනැගීමේ අරමුණ සපුරා ගැනීමට දැන්වත් ලංකාව සමත්වේද? එදා අපට සිටි අවශ්‍ය තරමට ප්‍රඥාව නැති අසාර්ථක නායකයන්ය. ප්‍රශ්න අවුල් කරගැනීමට ප්‍රඥාව නැතිකම වැදගත් හේතුවක් ලෙස බලපෑවේය. ඒ නිසා ඇති වූ මහා විනාශය විසින්වත්, අපේ වර්තමාන නායකයන් ප්‍රඥාවන්ත කිරීමට සමත් වී තිබේද? මට පෙනෙන දේශපාලන අවකාශය තුළ නම්, ප්‍රඥාවවත් ධෛර්යවත් පෙනෙනතෙක් මානයක නැත. හැම තැනකම පෙනෙන්න තියෙන්නෙ අඳුරෙ අතපතගාන තත්ත්වයකි. සමාජයට නම් නායකයනට නැති, වෙනදා පෙනෙන්නට නොතිබුණු කිසියම් ප්‍රඥාවක් පහළ වී තිබෙන බව පෙනේ. ප්‍රඥාව නැති නායකයන් දක්කාගෙන ඉදිරියට යාමේ හැකියාවක් සමාජයට තිබේද? මෙම ඓතිහාසික මොහොතේදී අපේ රටේ නායකයන්ට, රට ඉදිරියට ගැනීමට අවශ්‍ය කරන ප්‍රඥාව හා ධෛර්ය ලැබේවා. අතගාරික ධර්මපාලතුමා නූතන සිංහලයන් කෙරෙහිත්, ආරමුගම් නාවලඊතුමා නූතන දමිළයන් කෙරෙහිත් වැඩිම බලපෑමක් ඇති කළ චින්තකයන් දෙදෙනා සේ සැළකිය හැකිය. මේ දෙදෙනාම එදා පැවති ක්‍රිස්තියානි ආධිපත්‍යයට එරෙහිව හා බෞද්ධ හින්දු ආගමට හිමිව තිබූ අවලස්සන තත්ත්වය වෙනස් කිරීම සඳහා ඉතා බලවත් ලෙස හා නිර්භීත ලෙස ක්‍රියා කළ නායකයන් දෙදෙනෙකි. එහෙත් එම නායකයන් දෙදෙනා එම අරමුණ කරා යාමට යොදා ගත් ක්‍රියාකාරකම් ජාතිය හේද බින්න කිරීමට මිස සමගි කිරීමට හේතු නොවීය.

ඒ කාලයේදී රටේ වැඩවසම් කුල ක්‍රමයට විශාල පිළිගැනීමක් තිබුණි. ඒ මගින් රටේ සිංහල දෙමළ ජනතාව පහත් ලෙස ප්‍රහේදු දෙකකට වෙන්කර තිබුණි. අරමුගම් නාවලඊතුමා හින්දු කුල ක්‍රමය වෙනුවෙන් පෙනී සිටියේය. පීඩිත කුලවල දරුවන් වංශවත් කුලවල දරුවන් සමග එක පන්ති කාමරයේ තබා උගන්වන ක්‍රමයට එතුමා විරුද්ධ විය. අතගාරික ධර්මපාලතුමා සිංහල කුල ක්‍රමය පමණක් නොව, ශාසනයේ පැවති කුල භේදයද ඉවසන ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. ඔහු ගොඩනගන්නට අපේක්ෂා කළ ලංකාව තුළ සිංහල බෞද්ධයන්ට හැර දමිළයන්ට, මුස්ලිම්වරුන්ට, බරිගර්වරුන්ට පමණක් නොව සිංහල ක්‍රිස්තියානිත්ට පවා තැනක් නොවීය. ඔහු වෙදාන් කොට සැළකුවේ සිංහල බෞද්ධයන් පමණය. 1915 සිංහල මුස්ලිම් කෝලාහලය අතගාරික ධර්මපාලතුමා විසින් සිංහල බෞද්ධ ජනයා අතර වපුරන ලද අාගම්වාදී, වර්ගවාදී

මහා විනාශයක් ඇතිවීමෙන් පසුව, නිදහස් ස්වෛරී සම්පූර්ණ කරගැනීමට අසමත් වූ ජාතිය ගොඩනැගීමේ අරමුණ සපුරා ගැනීමට දැන්වත් ලංකාව සමත්වේද?

ප්‍රබෝධය පපුරා ගිය අවස්ථාවක් ලෙස සැළකිය හැකිය.

ආගමික පුණර්ජීවන අදියරය අවසන් කොට, දේශපාලන ප්‍රතිසංස්කරණ අදියරය දිනා ගැනීමේ අදියරයට එළඹුනු පසු, මේ රටවල් දෙකේ නිදහස් ව්‍යාපාර දෙක නිදහස දිනාගැනීම සඳහා දියත් කළ වැඩසටහන් දෙක අතර අහසට පොළොව තරම් ලොකු වෙනසක් දිස් විය. ඉන්දියානු නිදහස් ව්‍යාපාරයේ නායකයන්ට ඕනානය ආධිපත්‍යයෙන් ඉන්දියාව නිදහස් කරගත යුතු ආකාරය ගැනත්, ඒ සඳහා කරන අරගලය තුළ ජාතික රාජ්‍ය පැවැත්ම ගැනත්, ඉන්දියානු රාජ්‍ය ගොඩනගාගත යුතු ආකාරය ගැනත් තියුණු අවබෝධයක් තිබුණි. එහෙත් ලංකාවේ නිදහස වෙනුවෙන් පෙනී සිටි අපේ නායකයන්ට එවැනි අවබෝධයක් නොවීය. ඔවුන් අපේක්ෂා කළේ සරල බල හුවමාරුවක් පමණකි. ජාතික රාජ්‍යයේ යහපැවැත්ම සඳහා ලාංකික ජාතිය ගොඩනගා ගැනීමේ ප්‍රශ්නය ගැන ඔවුන්ට මොනම අවබෝධයක්වත් තිබුණේ නැත. ඉන්දීය ජාතිය ගොඩනැගීම සඳහා කුල භේදයට තිබෙන පිළිගැනීමත්, හින්දු මුස්ලිම් භේදයත් අහෝසි කොට භේදයකින් තොරව සියලු ඉන්දියානුන්ට සමාන අයිතිවාසිකම් හා සමාන ගෞරවය ලබාදීමේ අවශ්‍යතාව ඉන්දියානු නිදහස් ව්‍යාපාරය හොඳින් තේරුම්ගෙන තිබුණි. ඒ සඳහා මහත්මයා දැනුම්වත් කිරීම සඳහා සැළසුම් කරන ලද, මහා පරිමාණයේ මතවාදී ව්‍යාපාරයක් සඳහා වැඩසටහනක් එම ව්‍යාපාරයට තිබුණි. අස්පර්ෂනීයත්වයට එරෙහිව පීඩිත කුලවලට කෝවිල්වලට ඇතුල්වන තහංචිවලට එරෙහිව රටපුරා තිබෙන කෝවිල් ඉදිරිපිට මහා සත්‍යග්‍රහ ව්‍යාපාර පැවැත්වුහ. ඒවට ලක්ෂ ගණනින් මිනිස්සු සහභාගිවූහ. ඉන්දු මුස්ලිම් සහජීවනය සඳහා පවත්වාගෙන ගිය ව්‍යාපාරය ජන ජීවිතය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කළේය. අවසානයේ දී ගාන්ධි ඝාතනයට ලක්වුයේ ද එහි ප්‍රතිඵලයක් වශයෙනි. පාකිස්තානය වශයෙන් වෙන්වීමක් ඇතිවීම වළකා ගැනීමට බැරි වුවද පාකිස්තානයට එකතු වූ මුස්ලිම් ජනයාට වැඩි මුස්ලිම් ජනතාවක් ඉන්දියාවේ තරත කරගැනීමට ඉන්දියාව සමත් විය.

ගාන්ධි ඝාතනයට ලක්වන අවස්ථාව වන විටත් හින්දු මුස්ලිම් කෝලාහලය තිබුණේ ගිනිගත් තත්ත්වයකය. ගාන්ධිගෙ මරණයත් සමග සියලු ගිනි නිවී ගාන්ධිගේ චිතකයෙන් නැගෙන ගින්න, ඉන්දියාවේ ඉතිරි වූ එකම ගින්න බවට පත්විය. ඉන්දීය ජාතිය ගොඩනැගීමේ ක්‍රියාදාමය, ඒ සමග කිසියම් ප්‍රමාණයකට සම්පූර්ණ විය. ඉන්පසුව ඇති කරගන්නා ලද තව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හේදයකින් තොරව සියලු ඉන්දියානුවන්ට සමාන අයිතිවාසිකම් සමග සමාන ගෞරවය ලබා දුන්නේය.

එහෙත් ලංකාවේ නිදහස වෙනුවෙන් පෙනී සිටි සිංහල, දෙමළ මුස්ලිම් නායකයන්ට ජාතික රාජ්‍ය ගැන හෝ ඊට අවශ්‍ය ජාතිය ගොඩනැගීම පිළිබඳ කිසිදු නිරවුල් අවබෝධයක් තිබුණේ නැත. ඔවුන් අතර සිටි සමහර නායකයන් ලාංකීය ජාතියක් ගැන කතා කළත් ඒ කිසිවෙකුට ජාතිය ගොඩනගා ගත යුතුව තිබෙන්නේ කවර ආකාරයකට ද යන්න ගැන කිසිම අවබෝධයක් නොවීය. ඒ නායකයන්ගෙ දැනුම කොයිතරම් සීමාසහිත තත්ත්වයක තිබුණිද යත්, ඔවුන්ට මානව අයිතිවාසිකම් ගැන පවා අවබෝධයක් නොවීය. ලංකාවේ මානව අයිතිවාසිකම් කතිකාව කරළියට එන්නෙ 70දශකයේ දිය. එහෙත් ඉන්දියානු නිදහස් ව්‍යාපාරයට 1936වන විටත් තමන්ගේම වන මානව අයිතිවාසිකම් ප්‍රඥප්තියක් තිබුණි. ඉන්දියානු නායකයන්ට සාපේක්ෂව අපේ නායකයන්ගේ දේශපාලන දැනුමේ අන්ත දුප්පත් කමේ තරම අපිට තේරුම් ගත හැකිය.

ලංකාවේ ජාතිය ගොඩනැගීම පිළිබඳ ප්‍රශ්නය අවුල් ජාලාවක් බවට පත්වීම, අපේ රටේ දේශපාලන ව්‍යාපාරවලට හා ඒවායේ නායකයන්ට එම ප්‍රශ්න පිළිබඳව තිබූ අවබෝධයක් ගැතිකමද වැදගත් හේතුවක් ලෙස බලපෑවේය. මුලදී ලංකා ජාතික සංගමය තුළ සියලු වර්ගවලට අයත් නායකයන් එකට එක්වී සිටියහ. ඒ සමගිය ඉක්මනින් බිඳ වැටුණේ ද බහුතර බලයක් ඉදිරියේ සුලුතර අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යොදාගත හැකි ලිබරල් විධිවිධාන ගැන දෙමළ මුස්ලිම් සුළු ජාතික නායකයන්ට සේම සිංහල නායකයන්ටද හරි අවබෝධයක් නොතිබුණු නිසාය.

කොල්බෆක් පතිසංස්කරණ යටතේ 1833දී විධායක හා ව්‍යවස්ථාදායක ක්‍රමයක් ඇති කිරීමෙන් පසුව නිලලත් සාමාජිකයන් 9දෙනෙකුගෙන් හා නිලනොලත් සාමාජිකයන් 6දෙනෙකුගෙන් යුතු ව්‍යවස්ථා සභාවේ ප්‍රදේශීය ජනයා වෙනුවෙන් ජනවර්ග තුනෙන් නියෝජිතයන් තුන්දෙනෙකු පත්කර ගැණුනි. එහි දී ජනවර්ගවල ප්‍රමාණය සැලකිල්ලට ගැනීමක් සිදු නොවීය. එහි දී වැදගත් කොට සලකන ලද්දේ උපදේශක සභාවක් වශයෙන් ජන වර්ගවලට ලැබිය යුතු නියෝජනය ගැන පමණකි. එය අනාගතයේ පාර්ලිමේන්තු ආණ්ඩුවක් දක්වා විකාශනය වන ක්‍රියාවලියක ප්‍රාරම්භක අවස්ථාව ලෙස සලකනොත්, පසුව ක්‍රමයෙන් ජනවර්ගවල අනුපාතිකයන්ට ගැලපෙන ආසන ප්‍රමාණයක් ලැබෙන තත්ත්වයක් කරා විකාශනය වීම නොවැළැක්විය හැකිය. එහෙත් ඒ වෙනස එසේ සිදුනතා දකින්නට දෙමළ නායකයන් කැමති නොවීය.

ආසන වෙන්කිරීමේ දී 2/1අනුපාතයකට වෙන්කළ යුතු බව දෙමළ නායකයින්ගේ මතය වුනා. සුලු ජාතීන්ට බර තබන ප්‍රාදේශීය නියෝජනයක් ඇති කළ යුතු බව සිංහල නායකයන්ගේ මතය විය. මේ දෙපිරිසේම ප්‍රවේශය ප්‍රජාතන්ත්‍රවාදයට අනුකූල නොවීය. සිංහල ජනගහනයේ ප්‍රමාණයට ගැලපෙන විශාල නියෝජනයක් සිංහලයින්ට ලැබීම මගින් සුලු ජාතීන් පීඩාවට පත්කරන තත්ත්වයක් වලකා ගැනීම සඳහා යොදාගත යුතු ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිකර්ම පිළිබඳ අවබෝධයක් දෙමළ හා මුස්ලිම් නායකයන්ට තිබුණා නැත. අනෙක් අතට සුලු ජාතීන් අතර ගොඩනැගෙමින් තිබුණු බිය පහකිරීම සඳහා යොදාගත හැකි ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිකර්ම පිළිබඳ අවබෝධයක් සිංහල නායකයන්ටත් නොතිබුණි.

පොන්නම්බලම්ගෙ පණහට පණහේ ඉල්ලීම ජාතීන් අතර පැවති එම ප්‍රවේශයේ අවුල් සහගත බව හා ප්‍රජාතන්ත්‍ර විරෝධී බව හොඳින් පෙනුන්මි කළ අවස්ථාවකි. 1925 ඇති වූ බෙදීම නිදහස දක්වා බලපාන ස්ථිර බෙදීමක් බවට පත්විය. සුලුජාතික නායකයන් කල්පනා කළ ආකාරයේ අවුල් සහගත බවක් තිබුණා සේම, සිංහල නායකයන් කල්පනා කළ ආකාරයේ අවුල් සහගත බවක්ද තිබුණේය. දෙගොල්ලන්ටම ඒ සඳහා ඇතිකර ගතයුතු ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිකර්ම පිළිබඳ අවශ්‍ය මනා අවබෝධයක් නොවීය. ඒ කාලයේ ජාතිය ගොඩනැගීම පිළිබඳ අවබෝධයක් තිබුණු එකම සංවිධානය ලෙස සැළකිය හැක්කේ යාපනයේ තරුණ සංගමය පමණකි. ඔවුනු කුල භේදයට එරෙහිව පෙනී සිටියහ. සිංහල දෙමළ මුස්ලිම් සමගියක් වෙනුවෙන් පෙනී සිටියහ. එහෙත් ඔවුන් ඉන්දියානු කොන්ග්‍රසයේ කාබන් පිටපතක් ලෙස ක්‍රියා කිරීමට උත්සාහ දැරීම තුළ තමන්ගෙ පැවැත්ම ඉක්මනින් අහිමි කර ගත්හ. ඇත්ත වශයෙන්ම මේ කාලයේ ලංකාවේ මාක්ස්වාදීන්ටත් මේ ප්‍රශ්නය නිරවුල් කරගැනීම සඳහා කිසිම ප්‍රවේශයක් නොවීය. ඔවුන් අතින් වුයේද මේ ප්‍රශ්නය උග්‍ර කිරීම සහ අවුල් කිරීමය. ඔවුන්ට වැදගත් වුයේ ජාතිය නොව පන්තියයි. ඉන්දියාවේ මාක්ස්වාදීන් ජාතිය ගොඩනැගීමේ ව්‍යාපාරයට සෘජෙන දායකත්වයක් ලබාදී ඇත. ලංකාවේ මාක්ස්වාදීන්ට ඒ කාර්යභාරය ඉටුකරගත නොහැකි විය. අවසානයේ ලංකාවට නිදහස ලබාදෙනවාට විරුද්ධවෙන සමාජ ප්‍රවනතා දෙකක් ගොඩනැගී තිබුණි. ඉන් එකක් සුලුජාතීන්ගෙන්ද අනෙක පීඩිත කුලවලින්ද සමන්විත විය.

නිදහස ලැබීමෙන් සිංහල ආධිපත්‍යයක් ඇති වී, ඔවුන් අතින් තමන් පීඩාවට ලක්වෙන තත්ත්වයක් ඇතිවනු ඇතැයි කියා සුලු ජාතික නායකයන් කල්පනා කළහ. නිදහස ලැබී ගොවිගම හා වෙල්ලාල ආධිපත්‍යයක් ඇති වී තමන් පීඩාවට පත්කරන තත්ත්යක් ඇතිවනු ඇතැයි පීඩිත කුලවල නායකයන් කල්පනා කළහ. මේ කණ්ඩායම් දෙක වෙනවෙන පළමුව ඩොනමෝර් කොමිසමටත්, දෙවනුව සොල්බරි කොමිසන් සභාවටත් තමන්ගෙ දුක් ගැනවිලි ඉදිරිපත් කළහ. ඒ වනවිට සුලු ජාතීන්ගේ ප්‍රශ්නයට අතිරේකව පීඩිත කුල පිළිබඳ බරපතල ප්‍රශ්නයකුත් රටේ පැවති බව ඉන් පෙනෙයි. යාපනේ මේ තත්ත්වය තිබුණේ දකුණටත් වඩා ගිනිගනිමින් තිබෙන තත්ත්වයක.

නිදහස දිනා ගන්නා ලද්දේ එම ප්‍රධාන ප්‍රශ්න දෙකට විසඳුමක් නැතිවය. නිදහස ලැබීමෙන් පසුත්, ප්‍රශ්න දෙක විසඳාගැනීමට උත්සාහ ගැනීමක් සිදුනොවීය. නිදහස ලබාගත්තේ ජාතික රාජ්‍ය සඳහා අවශ්‍ය ජාතිය ගොඩනගා ගැනීමකින් තොරවය. නිදහසින් පසුත් ඉදිරියට යන්නට උත්සාහ කළේ ජාතිය ගොඩනගා ගැනීමේ උත්සාහයකින් තොරවය. ඉන්පසු සුලුජාතීන්ට සේම සියලු කුලවල ජනයාටද ජීවත් වන්නට සිදුවුයේ සමාන අයිතිවාසිකම් හා සමාන ගෞරවය අභිමිකරනු ලැබූ දෙවෙනි පෙළ තත්ත්වයකය. ඒ අශෝඛන තත්ත්වය ඊට ගොදුරු වී සිටි තරුණ තරුණියන් යක්ෂාවේශ වී ක්‍රියාකරන තත්ත්වයකට තල්ලු කිරීමට හේතු විය. අවසානයේ ලංකාව නිදහස ලබාගත්තේ එකම ලේ බින්දුවක්වත් සොලවන්නේ නැතිවය. එහෙත් එකම ලේ බින්දුවක් නොසොල්වා නිදහස ලබා ගත් රට නිදහස ලැබී අවුරුදු 30කට පසුව එක දිගට අවුරුදු 30ක්ම ලේ ගලන රටක් බවට පත් විය. ජාතිය ගොඩනගාගැනීමට අසමත් වීම මේ ලේ වැගිරීම කෙරේ බලපෑ ප්‍රධාන හේතුව ලෙස සැළකිය හැකිය. ඒ ලේ වැගිරීම කෙරෙහි වර්ගය පමණක් නොව කුලයද බලපෑවේය.

විජේවීර කරාව කුලයේ කෙනෙකු වන විට, ඔහුගේ දෙවෙනියා සොළි කුලේ කෙනෙකු විය. ප්‍රභාකරන් කරයා කුලේ කෙනෙකුවන විට ඔහුගේ දෙවෙනියා බාබර් කුලේ කෙනෙකු විය. සමස්ත අර්බුදය කෙරෙහිම බලපෑ ප්‍රධාන හේතු දෙක එම නිදර්ශන දෙක තුළ හොඳින් සංඛේතවත් වෙයි. මෙම අර්බුධය තුළ, වර්ගය ප්‍රසිද්ධියේ කැරලි ගසන විට කුලය සැඟවී ගරිල්ලා යුද්ධයක් කළේය.

මහා විනාශයක් ඇතිවීමෙන් පසුව, නිදහස් ස්වෛරී සම්පූර්ණ කරගැනීමට අසමත් වූ ජාතිය ගොඩනැගීමේ අරමුණ සපුරා ගැනීමට දැන්වත් ලංකාව සමත්වේද? එදා අපට සිටි අවශ්‍ය තරමට ප්‍රඥාව නැති අසාර්ථක නායකයන්ය. ප්‍රශ්න අවුල් කරගැනීමට ප්‍රඥාව නැතිකම වැදගත් හේතුවක් ලෙස බලපෑවේය. ඒ නිසා ඇති වූ මහා විනාශය විසින්වත්, අපේ වර්තමාන නායකයන් ප්‍රඥාවන්ත කිරීමට සමත් වී තිබේද? මට පෙනෙන දේශපාලන අවකාශය තුළ නම්, ප්‍රඥාවවත් ධෛර්යවත් පෙනෙනතෙක් මානයක නැත. හැම තැනකම පෙනෙන්න තියෙන්නෙ අඳුරෙ අතපතගාන තත්ත්වයකි. සමාජයට නම් නායකයනට නැති, වෙනදා පෙනෙන්නට නොතිබුණු කිසියම් ප්‍රඥාවක් පහළ වී තිබෙන බව පෙනේ. ප්‍රඥාව නැති නායකයන් දක්කාගෙන ඉදිරියට යාමේ හැකියාවක් සමාජයට තිබේද? මෙම ඓතිහාසික මොහොතේදී අපේ රටේ නායකයන්ට, රට ඉදිරියට ගැනීමට අවශ්‍ය කරන ප්‍රඥාව හා ධෛර්ය ලැබේවා.